

# සිරි දළදාගමනය සිනමා සිත්තම සම අනුග්‍රහය මෙල්බර්න් නුවරින්



බුදු දහම අදහන බුදු ගුණ මෙනෙහි කරන සියලු දෙනාගේම නොමඳ ගෞරවයට පාත්‍ර වන දළදා හාමුදුරුවන් ගේ අනුභාවය ලෝ වැසියන් හට කියා දෙනුවස් නිර්මාණය කරනු ලබන දළදාගමනය චිත්‍රපටය නොබෝදා ශ්‍රී ලංකාවේදී සුබ මොහොතින් ආරම්භ විය.

එම කටයුත්තට මූලිකත්වය ගෙන කටයුතු කරන ඩැන්ඩිනොන් ධර්මදීප මධ්‍යස්ථානයේ විහාරාධිපති අකරවිට සංඝානන්ද ස්වාමීන් වහන්සේ සමග සන්නස වෙනුවෙන් අපි කෙටි සාකච්ඡාවක යෙදුණෙමු.

**මේ චිත්‍රපටය නිර්මාණය කිරීම සඳහා අපේ හාමුදුරුවන් යොමුවුණ විශේෂ කාරණයක් තියෙනවද?**

විශේෂ කාරණා කීපයක්ම තිබෙනවා. යම් පණිවිඩයක් ලෝකයට කියා පෑමේදී ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය ඉතාමත් වැදගත් වෙනවා. ඒ අතරින් සිනමාව ඉතාමත්ම වැදගත් වෙනවා. ඉතිහාසයේ කවුරුවත් අත ගසා නැති මේ වැඩේට උර දෙන්න මට හිතුණා. අපි දළදා හාමුදුරුවන්ට ගරු කරන බව දන්නවා. නමුත් මෙහි තිබෙන වැදගත් කම ජනතාවට මේ දෙය හරියාකාරව කියා දීම. ඒ එක්කම බුදුරජුන් දේශනා කළ දම්සක් පැවතුම් සූත්‍රයෙන් පටන් ගෙන පිරිණිවන් මංචකය දක්වා කාලය තුළ දේශනා කරන ලද ධර්මස්කන්ධය ස්පර්ශ කළ දන්ත ධාතූන් වහන්සේ අපට කොයි තරම් වැදගත් ද?

අනෙක් කාරණාය මගේ උපාධි නිබන්ධනය සඳහා මා තේමා කොට ගත්තේ ශ්‍රී ලංකාවේ බෞද්ධ විහාර ආශ්‍රිතව ඉදිවවී තිබෙන ධාතු නිධන් කළ චෛත්‍ය පිළිබඳවයි. මගේ මේ නිබන්ධනය සඳහා මා සෑහෙන පරිශ්‍රමයක් දරුවා. එතැනදි මා මූලිකව වැඩි අවධානය යොමු කළේ දළදා හාමුදුරුවන් පිළිබඳවයි. එහිදී මහජනතාවගේ වැඩි අවධානය යොමු නොවූ කරුණු කාරණා රාශියක් සොයාගන්නට මට හැකි වුණා.

තවත් කාරණාවක් තිබෙනවා. මා ශ්‍රී ලංකාවේ දී වැඩ වාසය කළේ දළදා වහන්සේ වැඩ සිටි මාළිගාතැන්න රජ මහා විහාරයේ වීමයි. කෝට්ටේ යුගයේ දී දළදා වහන්සේ රැකවරණයේ සිටි හිරිපිටියේ රාළ දුටු සිහිනයක ප්‍රතිඵලයක් වශයෙන් දළදා වහන්සේ රැගෙන මාළිගාතැන්නේ රජමහා විහාරයේ කර වූ රහසිගත මාළිගයක දළදා වහන්සේ තැන්පත් කළ බව ඉතිහාසයේ සඳහන් වෙනවා.

**මේ චිත්‍රපටයේ පිටපත ඔබ වහන්සේට ලැබුණේ කෙසේ ද?**

ඒකත් අපූරු සිදුවීමක්. අප දායක සභාව විසින් අප විහාරයට ආධාර පිණිස මහින්දාගමනය නමැති බෞද්ධ චිත්‍රපටය පෙන්වනු ලැබුවා. මෙහිදී මෙම චිත්‍රපටය සමග එහි අධ්‍යක්ෂක වන සනත් අබේසේකර මහතාත් පැමිණියා. ඔහු ටික කලක් අපත් සමග සිටින විට මේ අදහස මුලින්ම දැන්වූවා. ඉන් පසු මා ඒ තිර පිටපත ගෙන කියවා බැලුවා. ඒ අතරතුරදී මට හිතුණා මේ කාර්යයට අපට යම් උදව්වක් කරන්නට හැකි නම් එය විශාල සේවයක් වන බව. මා මේ පිටපත පිළිබඳව මෙහි සිටින ප්‍රවීණයන් කීප දෙනෙකුගෙන් සහ දායක සභාවේ අදහස් විමසා සිටියා. ඔවුන් සියළු දෙනාගේමඅදහස් වූයේ මෙය චිත්‍රපටයක් හැටියට නිර්මාණය කිරීම ඉතාමත් සත් කාර්යයක් බවයි.

**මේ සඳහා ඔබ වහන්සේ පිරිවැය සොයා ගත්තේ කෙසේද?**

මූලික වශයෙන් මෙල්බර්න් නුවර සිටින අපගේ දායකයන්ට මේ පිළිබඳව අදහස ප්‍රකාශ කළ විට බොහෝ දෙනෙක් මෙයට උදව් උපකාර කරන්නට ඉදිරිපත් වුණා. ඒ එක්කම ලංකාවේ අප විසින් පිහිටුවා ගන්නා ලද බෝසත් ලංකා පදනම නමින් පදනමක් තිබෙනවා. මෙහි සිටින අයත් මේ සඳහා දායකත්වය ලබා දෙනවා. ඒ අනුව තමයි මෙය ක්‍රියාවට නංවන්න අපට හැකි වුණේ.

**මේ සඳහා ඊඒපී සමාගම සම්බන්ධ වන්නේ කෙසේ ද?**

මේ පිළිබඳව මූලිකව සාකච්ඡා කිරීමේ දී අපට වැටහුණ කාරණය තමයි මෙය ඓතිහාසික පුරාවෘත්යක් නිසා මෙය නිර්මාණය කිරීමට විශාල පිරිවැයක් යන බව. ඇස්තමේන්තු මුදල විශාල බැවින් අපට සිදුවුණා මෙයට සම අනුග්‍රාහකත්වයක් සොයා ගන්නට. ඒ අනුව මේ අදහස ඊඒපී සමූහ ව්‍යාපාරයේ අධිපති ආචාර්ය සෝමා එදිරිසිංහ මහත්මියට දැන්වූ විගසම එතුමියත් මෙහි තිබෙන වැදගත් කම වටහා ගෙන මෙයට සමනිෂ්පාදකත්වය ලබා දෙන්නට එකඟ වුණා. ඒ අනුව මේ චිත්‍රපටය මේ දිනවල රූපගත කිරීම ආරම්භ කර තිබෙනවා.

**මෙයට උදව් උපකාර කළ වෙනත් විශේෂ පුද්ගලයන් ඉන්නවද?**

ඔව්. පුරාවිද්‍යා චක්‍රවර්ති එල්ලාවල මේධානන්ද හාමුදුරුවන් මේ පිටපත පිළිබඳ විශේෂ උපදෙස් දුන්නා. එය විශේෂයෙන් සඳහන් කරන්න ඕනෙ.

සිරි දළදාගමනය සිනමා පටයේ අධ්‍යක්ෂ සනත් අබේසේකර ඉන් අනතුරුව අප හා අදහස් හුවමාරු කර ගත්තා.

**සනත්. මේ ඔබේ කී වෙනි නිර්මාණයද?**

මගේ නිර්මාණකරණය ගැන කතා කරනවා නම් මම මුලින්ම ටෙලි නාට්‍ය නිර්මාණකරුවකු විදිහට තමයි ඉදිරියට ආවේ. මම දැනට ටෙලි නාට්‍ය 30 කට අධික සංඛ්‍යාවක් පිටපත් ලියමින් අධ්‍යක්ෂණය කර තිබෙනවා මෙහිදී මට විශාල අත්දැකීම් සම්භාරයක් ලබා ගන්නට හැකි වුණා. එපමණක් නොවෙයි චිත්‍රපට තිර රචනාත් විශාල සංඛ්‍යාවක් මා ලියා තිබෙනවා. ඊට අමතරව මහින්දාගමනය චිත්‍රපටයත් මා විසින් පිටපත ලියා අධ්‍යක්ෂණය කරනු ලැබුවා. දෙවන චිත්‍රපටය ලෙස තමයි මේ සිරි දළදාගමනය ඉදිරියට එන්නේ.



**සිරි දළදාගමනය වැනි කතාවකින් සිනමා පටයක් නිර්මාණය කරන්නට ඔබ සිතුවේ ඇයි?**

මම මගේ පළමු චිත්‍රපටය වන මහින්දාගමනය පිටපත රචනා කරන අවධියේ ඉතිහාසය පිළිබඳ විශාල අධ්‍යයනයක් කරන්නට මට සිදුවුණා. මහාවංශය ඇතුළු ඉතිහාස පොත් විශාල සංඛ්‍යාවක් මම පරිශීලනය කළා. ඒ අතරේ දී මට දළදා හාමුදුරුවන් ගැන ලියැවුණ පොත් කීපයකුත් කියවන්න ලැබුණා. එහිදී ධාඨාවංශයත් පරිශීලනය කළා. මට හිතුණා දැනට කවුරුවත් අත නොගසා ඇති දැනට ජීවමානව වැඩ සිටින දළදා හාමුදුරුවන් ගැන නිර්මාණයක් කිරීම දළදා වහන්සේ වෙසෙන රටේ පුරවැසියෙක් විදිහට මගේ වගකීමක් කියා. ඒ අනුව මා මේ පිටපත ලිව්වා. අනුරාධපුරයේ මේඝගිරි විහාරයට හේමමාලා කුමරිය හා දන්ත කුමරු විසින් වඩම්මාගෙන පැමිණි දන්ත ධාතූන් වහන්සේ මූණ පෑ දහසක් කම්කටොළු ගැන අපේ සමාජය දැනුවත් කිරීමට මම මෙයින් උණන්දු වෙනවා.

**මේ ඓතිහාසික කරුණු පිළිබඳව ඔබට යම් යම් අයගෙන් උපදෙස් ලැබෙන්නටත් ඇති නේද?**

ඔව්. මට මේ ගැන බෙල්ලන්විල විමලරතන හාමුදුරුවොත් එල්ලාවල මේධානන්ද හාමුරුවොත් උඩුවේ ධම්මානන්ද හාමුදුරුවොත් උපදෙස් දුන්නා. මේ ගෞරවණීය ස්වාමින් වහන්සේලාගේ අනුමැතිය හා ආශිර්වාදය මට මේ කාර්යයට ලැබුණා.

අකරවිට සංඝානන්ද ස්වාමින් වහන්සේ මේ චිත්‍රපටයට සම්බන්ධ වන්නේ කෙසේද?

මුලින්ම මම උන්වහන්සේට මේ කටයුත්තට අත දීම තැන මගේ ගෞරවය පිළිගන්වන්නට කැමතියි. මම මේ පිටපත ලියාගෙන බොහෝ නිෂ්පාදයන් හමුවුණාත් නිෂ්පාදනය සඳහා කිසිවකු ලැබුණේ නැහැ මේයට ජනාධිපති තුමාගේ විශේෂ අනුග්‍රහය ලැබුණාත් මෙයට යන විශාල පිරිවැය නිසාත් මෙහි ඇති වටිනාකම් පිළිබඳ කිසිවකුට වටහා ගන්නට නොහැකි වීම නිසාදෝ අනුග්‍රාහකයක සොයා ගන්නට නොහැකි වුණා. වාසනාවට මෙන් මෙල්බර්න් සංචාරයේදී මේ පිළිබඳව අපේ හාමුදුරුවන්වහන්සේ සමග සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස මගේ දෙවන නිෂ්පාදනය අපේ ජනතාවට ඉදිරිපත් කිරීමේ වාසනාව මට උදා වුණා.

**දැන් මේ සිනමාපටයේ නිෂ්පාදනය පවතින්නේ කුමන අදියරේද?**

2012 මාර්තු මාසයේදී මෙහි මුහුරත් උළෙල පැවැත්වුණා. සිනමා පටය නිම කර 2013 වෙසක් දිනය දා මෙය ඊඒපී සිනමා ශාලාවන්හිදී තිරගත කරන්නටයි අපේ සැළසුම.

**මෙහි රඟපාන නලුනිළියන් ගැන කිව්වොත්**

මේ සඳහා ප්‍රවීණ නලු නිළියන් විශාල සංඛ්‍යාවක් සහභාගි වෙනවා. රවීන්ද්‍ර රන්දෙණිය ශ්‍රියන්ත මෙන්ඩිස් ගීතා කුමාරසිංහ දිල්හානි ඒකනායක රන්ජන් රාමනායක සිරිල් ධර්මවර්ධන ඇතුළු ප්‍රවීණයන් සමග හේමමාලා කුමරිය ලෙස පුෂ්පිකා සඳමාලි ද සිල්වා රඟපෑමට එක්වෙනවා. ඒ එක්කම කැමරා කරණයෙන් සුමින් වීරසිංහත් සංගීතයෙන් රංග දසනායකත් කලා අධ්‍යක්ෂණයෙන් වෙලෙගෙදර රණසිංහත් එක්වෙනවා. මේ දැවැන්ත නිෂ්පාදනයේ නිෂ්පාදන කළමණාකරණය කරන්නේ නිහාල් සංජය මහතායි. මෙය ඉංග්‍රිසි උප ශීර්ෂ සමග ලෝකය පුරා පෙන්වන්නට අපි සිතා සිටිනවා.

මෙම නිර්මාණය සඳහා අපට සහය දක්වන ඩැන්ඩිනොන් ධර්මදීප මධ්‍යස්ථානයේ අධිපති අකරවිට සංඝානන්ද ස්වාමින්වහන්සේ ඇතුළු දායක සභාවටත් බෝසත් ලංකා පදනමටත් ඊඒපී සමූහ ආයතනයටත් මගේ ගෞරවය පිරිනමන්න කැමතියි.

සිරි දළදාගමනය වැනි ශ්‍රී ලාංකිකයනට අතිශය වැදගත් පුරාවෘත්තයක් සිනමාවට නැගීම ඉතා වැදගත් කටයුත්තකි. මේ සඳහා කැපවන සියලු දෙනාටම ඒ සඳහා අවැසි ශක්තිය හා ධෛර්යය ලැබේවායි සන්නස වෙනුවෙන් සුබ පතන්නවා.

සාකච්ඡා කළේ
ශ්‍රීනාත් මද්දුමගේ

